# කෑදර නරියා



# කැදර නරියා

# 2023

## කතා ප්‍රකාශනයකි

ISBN : 978-624-206-916-6

**කථාව හා චිත්‍ර - නිතිනි අබේසිංහ**

**පාසල - මහාමායා බාලිකා විදුහල - මහනුවර**

**2023/12/10**

# පිදුම

කතන්දර පොතක් ලිවීමට මාව

නිරතුරු දිරිගැන්වූ

නිලූෂිකා ගරුසිංහ ගුරු මෑණියන්ටත්

ආදරණීය දෙමාව්පියන්ටත්

සෙනෙහසින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි. මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර (විදුහල්පතිනිය)

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023. 10.20



දවසක් නරිහාමිට බඩගින්නක් හැදුනා.



මෙයා කෑමක් සොයාගන්න සිතා
කැළෑවේ හැමතැනම ඇවිද්දා.



ඔහොම යනකොට අසල ගුහාවක්
තිබුණා දැක්කා.

මෙයා ගුහාව ළඟට ගොස් එබිකම්කර
බැලුවා.



අසල ගසක සිටි කුරුළු පැටියෙක් ‘‘නරිහාමි මොකද සිංහරාළගේ ගුහාවට එබිකම් කරන්නේ.’’ කියා නාරි රාළගෙන් විමසුවා.



''මම මේ සිංහරාළ මුණගැහෙන්න
ආවා.'' නරිහාමි කුරුල්ලට පැවසුවා.



''සිංහරාළ මේ වෙලාවට කැලේ
සත්තුන්ගේ ප්‍රශ්න විසඳන්න යනවානේ.''
කියමින් කුරුල්ලා ඉගිලී ගියා.



'' කුරුල්ලත් ගිය එකේ මොනවාහරි
කෑමක් තියෙනවාද කියලා ඇතුළට
ගිහින් බලන්න ඕනි.''
නරියා තමාටම පවසා
ගනිමින් ගුහාව ඇතුළට ගියා.



ගුහාව ඇතුලේ විපරමින් බලන විට
කෑම පොදියක් තියෙනවා දැක්කා.



කෑම දැක්කා විතරයි නරිහාමිට
බඩගින්න තවත් වැඩි වුණා. බඩගින්න
වැඩිකමට නරිහාමි එක හුස්මට කෑම
පොදියම ගිල දැම්මා.



තමන්ගෙ පමණට වඩා කාපු නරියාට
ඇඟට ඉතාම අපහසුවක් දැනුණා.



සිංහරාළ එන්න කලින් මෙතනින් යන්න
ඕනී සිතා ගුහාවෙන් එලියට ආවා.



එහා මෙහා ඇවිඳමින් ඇගේ අමාරුව අඩුකරගන්න විවිධ බෙහෙත් කොළ කෑවා. අමාරුව නම් අඩු වුණේ නෑ.



වලස් වෙදරාළ ළඟටවත් යන්න ඕනි
කියලා නරියා පිටත් වුණා.



ඔය අතර සිංහරාළ රාජකාරි ඉවර
වෙලා ගුහාවට ආවා.



ටිකක් විවේක අරන් කෑම කන්න ඕනි කියලා සිංහරාළ කෑම තිබුණ තැනට ගියා. හරිම පුදුමයි කෑම එතන නෑ.



සිංහරාළ ගුහාවෙන් එළියට ඇවිත් වට පිට බැලුවා. ගුහාව ළඟ කවුරුත් හිටියේ නෑ. ‘‘ අද කවුරු හරි මගේ ගුහාවට ආවාද කුරුළුහාමි’’ කියලා කුරුළු පැටියාගෙන් ඇසුවා.




''ආ... ඔව් නරිහාමි ආවා සිංහරාළුව හමුවෙන්න කියලා ''

'' අෑ... මාව හමුවෙන්න නරිහාමි ආවා.! එහෙනම් නරිහාමි තමා මගේ කෑම කන්න ඇත්තේ. හොඳ පාඩමක් උගන්වන්නම්'' කියලා නරිහාමිව හොයාගෙන ගියා.



කැලේ හැමතැනම හෙව්වත් නරියා
දකින්න හිටියේ නෑ.ටිකක් දුර යන විට
වලස් වෙදරාළව සිංහරාළට මුණ ගැසුණා.
'' වලස් වෙදරාළ අර කෑදර නරියාව
එහෙම දැක්කද''



'' ඔව් ඇඟට හරි අමාරුයි කියලා මගෙන් බෙහෙත් ගන්න ඇවිත් ඉන්නවා. ඇයි සිංහරාළ නරිහාමිව හොයන්නේ '' කියලා වලස් වෙදරාළ ඇසුවා.

'' මගේ ගුහාවේ තිබුණු කෑම ටික සේරම කාලා ඒක වෙන්න ඇති අමාරුව. මම මේ හොඳ දඬුවමක් දෙන්න කියලා නරියාව හොයාගෙන ආවේ. ''

'' සිංහරාළ දඬුවම් දෙන්න ඕනි නෑ. ස්වභාව ධර්මයෙන්ම එයාට දඬුවම් ලැබිලා තියෙන්නේ කෑදර කමට.''

නරිහාමි ලැජ්ජාවෙන් බිම බලා ගත්තා. '' ආය ඔය වගේ වැඩ කරලා අහුවෙන්නේ එහෙම නෑ '' කියලා සිංහරාළ යන්න ගියා.

නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු!

ISBN : 978-624-206-892-3

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ